සීමාසහිත මොරවක්කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සම්තිය - කොටපොල

අයදුම්පත් කැඳවීම

අප සමිතියේ දැනට අනුමත පිරිස්බල තක්සේරුව අනුව සුදුප්පාඩුව ඇති පහත තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමත සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

EL 02 – මට්ටම

වැටුප් පරිමාණය : 47000 -1010X5 - 1260X5 - 1510X10 - 1760X10 - 2010X12 - 1151X70

සහ

ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍ය/කළමනාකරණ/ගණකාධිකරණ යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 03කට නොඅඩු පළපුරුද්ද/සුහුණුව ලබා තිබීම.

හෝ

ii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාරික සහනීකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර විභාගය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 03කට නොඅඩු පළපුරුද්ද/සුහුණුව ලබා තිබීම.

හෝ

උසස් ජාතික තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ගණකාධිකරණ/ව්‍යාපාර මූල්‍ය (HNDBF/HNDA) ඩිප්ලෝමාව (උපාධියට ගැලපෙන SLQF LEVEL 5 හෝ ඊට ඉහළ) සමත්වීම හා අදාළ ක්ෂේත්‍රයේ වසර 04ක පළපුරුද්ද

හෝ

iii EL 03 මට්ටමේ I ශ්‍රේණියේ ගණකාධිකාරී/අභ්‍යන්තර විගණක/බැංකු සේවා) තනතුරක සේවය කිරීම හෝ EL 03 මට්ටමේ II ශ්‍රේණියේ ගණකාධිකාරී/අභ්‍යන්තර විගණක/බැංකු සේවා) තනතුරක සේවය වසර 04ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

EL 03 – මට්ටම

වැටුප් පරිමාණය : 44500 - 880X5 - 1080X5 - 1280X10 - 1480X10 - 1680X12 - 102060

සහ

ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

අභ්‍යන්තර විගණක තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ්‍ය/කළමනාකරණ/ගණකාධිකරණ යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර01කට නොඅඩු පළපුරුද්ද/සුහුණුව ලබා තිබීම.
හෝ

(ii) උසස් ජාතික තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය/ගණකාධිකරණ (HNDBF/HNDA) ඩිප්ලෝමාව (උපාධියට ගැලපෙන SLQF Level 5 හෝ ඊට ඉහළ) සමත්වීම හා අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද.

හෝ

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාරික සහනීකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර විභාගය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 01කට නොඅඩු පළපුරුද්ද/සුහුණුව ලබා තිබීම.

හෝ

(iv) SUL මට්ටමේ II ශ්‍රේණියේ සහකාර ගණකාධිකාරී/සහකාර අභ්‍යන්තර විගණක/සහකාර බැංකු සේවා/කලාප කළමනාකරු තනතුරක වසර 02ක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ විගණනය/ගිණුම්කරණය/මූල්‍ය කළමනාකරණය/ක්ෂුද්‍ර මූල්‍ය/බැංකුකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

(v) OPL-1 මට්ටමේ I ශ්‍රේණියේ බැංකු/ගිණුම්/මූල්‍ය/අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක සේවය කිරීම සහ විගණනය/ගිණුම්කරණය/මූල්‍ය කළමනාකරණය/ක්ෂුද්‍ර මූල්‍ය/බැංකුකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

(vi) OPL-2 මට්ටමේ I ශ්‍රේණියේ බැංකු/ගිණුම්/මූල්‍ය/අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක වසර 05ක් සේවය කිරීම සහ විගණනය/ගිණුම්කරණය/මූල්‍ය කළමනාකරණය/ක්ෂුද්‍ර මූල්‍ය/බැංකුකරණය පිළිබඳ වසර 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

OPL 01 – මට්ටම

වැටුප් පරිමාණය : 38000 - 520X5 - 620X5 - 720X10 - 820X10 - 920X12 - 70140 සහ ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

ක්ෂේත්‍ර නිලධාරී (චතු) තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(i) ගණිතය, සිංහල/දෙමළ, ඇතුළුව විෂයන් 04කට සම්මාන සහිතව අ.පොස. සා/පෙළ ඉංග්‍රීසි විෂය ද ඇතුළුව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම

සහ

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් පවත්වන අදාළ ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීම

හෝ

රුහුණු විශ්ව විද්‍යාලයේ විද්‍යුත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කිරීම සහ අදාළ ක්ෂේත්‍රයේ ආයතනයක වසර 01කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

OPL 02 – මට්ටම

වැටුප් පරිමාණය : 36500 - 480X5 - 580X5 - 680X10 - 780X10 - 880X12 - 66960 සහ

ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

වෙළෙඳසැල් කළමනාකරු තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 03කට සම්මාන සහිතව අ.පොස. සා/පෙළ විභාගයෙන් විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම, හෝ

(II) MSL 1 තනතුරක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව සමත්වීම.

කළමනාකරණ සහකාර තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 03කට සම්මාන සහිතව අ.පොස. සා/පෙළ විභාගයෙන් ගණිතය විෂය ඇතුළුව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හෝ අ.පොස. උ/පෙළ විභාගය ඕනෑම විෂය ධාරාවකින් සමත්වීම හෝ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව/සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම.

(II) MSL-1 තනතුරක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව/සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම.

නිෂ්පාදන සහකාර (කෘෂි) තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) සිංහල/දෙමළ භාෂාව ඇතුළුව අ.පොස. සා/පෙළ විභාගයෙන් විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද.

MSL 2 – මට්ටම

වැටුප් පරිමාණය : 33750 - 310X5 - 3605 - 410X10 - 460X10 - 510X12 - 51920

සහ

ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

බස් කොන්දොස්තර තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් නිකුත් කරන කොන්දෙස්තර බලපත්‍රය ලබා තිබීම.

පොම්පකරු තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) 08 ශ්‍රේණියේ අධ්‍යාපන සහනීකය

MSL 3 – මට්ටම

වැටුප් පරිමාණය : 33000 - 290X5 - 340X5 - 390X10 - 440X10 - 490X12 - 50330

සහ

ද.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

සනීපාරක්ෂක කම්කරු තනතුර (III ශ්‍රේණිය)

මූලික සුදුසුකම් :

(I) අකුරු කියවීමේ සහ ලිවීමේ හැකියාව සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

වයස් සීමාව : අවු:18 ත් 45ත් අතර. දැනටමත් සමුපකාර සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

සැ : යු :

- වැටුපට අමතරව සමිති කාර්යය මණ්ඩලයට ලැබෙන දිරිදීමනා (වාර්ෂික/මාසික) සහ වෙනත් ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇත.
- දකුණු පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායක කරනු ලැබේ.
- දකුණු පළාතේ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කරනු ලබන අයදුම්පත් 2026.11.27 දින ප.ව. 03.00ට හෝ ඊට පූර්ව ලැබෙන සේ ගරු **සභාපති, සීමාසහිත මොරවක්කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සම්තිය, දෙනියාය පාර, කොටපොල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුය. අයදුම්පත් බාහිර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

සභාපති,
සී/ස මොරවක්කෝරළේ තේ නිපදවන්නන්ගේ
සමුපකාර සම්තිය,
කොටපොල.
2026.11.13